# අන්දරේ අග මෙහෙසිට කරපු හැටි

කට්ටිය දන්නවනෙ අන්දරේ ගැන. අන්දරේ joker වුනාට හරි handsome, romantic පොර. ඉතින් අන්දරේ කොහොම හරි පොරගෙ ගමේ හිටපු ලස්සනම කෙල්ලව දැලේ දා ගත්ත.

දුෂ්ටයා ගේමට Enter උනේ මේ වෙලාවේ .කරුමෙක මහත. දුෂ්ටය වෙන කව්රුත් නෙමේ රජා. රජා ගමනක් යනකොට අන්දරේගේ කෙල්ලව දැකල, කෙල්ලව අරන් ගිහින් අන්තඃපුරේ තියාගත්තා මදිවට අග මෙහෙසි කරගත්ත. අන්දරේට වහ කන්න උනේ. Love කලාට මොකද අන්දරේ කිසිම දෙයක් කොරල තිබ්බෙ නෑ මේ කෙල්ලට. අග මෙහෙසි උනාට පස්සේ මොනවහරි කරන්න ගිහින් බෙල්ල කපාගන්න බැනේ, එත් “වෙලාවක් ආවොත් දෙන්නම් වැඩේ කියල” අන්දරේ හිටියේ.

දවසක් අන්දරේ ,රජා, අගමෙහෙසි තුන්දෙනා රජාගේ උද්‍යානෙ ගමනක් යනවා.ඔහොම යනකොට රජා දැක්ක පැණි වරක ගෙඩියක් හොදට ඉදිලා තියෙනවා ගහේ..රජ වහාම අන්දරේට අණ කලා වහාම වරක ගෙඩිය කඩලා තමන්ට ගෙනත් දෙන්න කියල.අන්දරේත් හිතෙන බැන බැන ගහ ලගට ගිහින් අමාරුවෙන් ගහට නැග්ග.. නැගල වරක ගෙඩිය කඩනකොට පොරට රජාවයි අග මෙහෙසිවයි පේනවා.

මේ වෙලාවේ අන්දරේට ගණදෙවි නුවන පහල උනා ..පොර වරක ගෙඩිය කඩන එක පැත්තකින් තියල හිනා වෙන්න පටන් ගත්ත සද්දෙන් ..රජාට මල, මේක වරක කඩන්න යැව්වම මගුල් නටනවා කියල.අන්දරේ හිනා වෙලා හිනා වෙලා ඉවර වෙලා වරක ගෙඩිය කඩාගෙන පල්ලෙහට බැස්ස.

රජා මල පැනල කිව්වා. “බොල අන්දරේ,තෝ ගහ උඩ ඉඳගෙන මටද බොල හිනා උනේ ?? ” කියල..එතකොට අන්දරේ කිවා, “පස්වාන් දහසකට බුදුවෙන්න රජ තුමනි..මම අර ගහ උඩට නැග්ගම දැක්ක රජතුමා අගමෙහෙසි එක්ක අහවල් වැඩේ කරනවා මේ මහා දවල්” කියල …රජාට යකා නැග්ග.”තොට විකාරද යකෝ.මම දේවිය එක්ක මුකුත් කලේ නෑ බොල මෙතන.තෝව මරනවා බොරු කතා කියනවට” කියල කිවා .අන්දරේ කිව්වා ” එහෙනම් රජ තුමනි ඔබතුමාම උඩට නැගල බලන්න.මම දෙවිය එක්ක අහවල් වැඩේ කරනවා පෙනේවි ටක්කෙටම. දැක්කේ නැත්නම් මාව උල තියන්න” කියල.

රජට පිස්සු හැදුන. යකෝ මු ජිවිතේ පරදුවට තියල කියන්නේ මොකක් හරි ඇති කියල නැග්ග ගහ උඩට …ටික වෙලාවකින් ගහෙන් බැස්ස රජ ඇවිත් කිව්වේ නැතැයි ..”ඇත්තනේ බන් අන්දරේ .එක පුදුම ගහක්නේ..මම ගහ උඩදී දැක්කනේ උඹ දේවිය අහවල් වැඩේ කරනවා” කියල …….

Published in www.elapatta.co.cc